මගේ අංකය - JSC/SEC/CIR-L/2025

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක - 16**

සියළුම මහාධිකරණ විනිසුරුවරුන් හා
සියළුම අධිකරණ නිලධාරින් වෙත,

**<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 422 A ප්‍රකාරව අධිකරණවල ගොඩ ගැසී පවතින නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම සම්බන්ධව</u>**

උක්ත චක්‍රලේඛය මගින් ඔබ අධිකරණයේ ගොඩගැසී ඇති නඩු භාණ්ඩ 2025.12.31 දින හෝ ඊට පෙර නිශ්කාෂණය කල යුතු බවට දන්වා ඇත. එම කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය මත 2025 ඔක්තෝබර් මස 18 දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා කාල සීමාව තුල සති අන්ත දිනවල හෝ (සෙනසුරාදා/ඉරිදා) රජයේ නිවාඩු දිනයක දි නැවත අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අවසර අයැදීමකින් තොරව පහත සඳහන් කොන්දේසිවලට යටත්ව එකී කාර්යයන් හී නිරත විය හැකි බව මෙයින් දන්වා සිටිමි.

I. මහාධිකරණයක නඩු භාණ්ඩ කාමරය හෝ ලේඛනාගාරය විවෘත කිරීම මහාධිකරණ විනිසුරු විසින් නම් කල සුදුසු නිලධාරියකුගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කල යුතුය.
II. දිසා/මහේස්ත්‍රාත් අධිකරණයක හෝ මහේස්ත්‍රාත් අධිකරණයක නඩු භාණ්ඩ කාමරය හෝ ලේඛනාගාරය විවෘත කිරීම දිසා විනිසුරු, මහේස්ත්‍රාත්, අතිරේක දිසා විනිසුරු හෝ අතිරේක මහේස්ත්‍රාත්වරයෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කල යුතුය.
III. අධිකරණ කාර්යාලය විවෘත කිරීම රෙජිස්ට්‍රාර් හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කල යුතුය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ඩී.එම්.ජේ. දිසානායක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට

ඩී.එම්.ජේ.දිසානායක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝබර් මස 15 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.